# ව්‍යුත්පන්න

## ඉගෙනුම් ක්‍රියාවලියට අත්වැලක්

## නිපුණතා මට්ටම 14.1

1.




$y$ යනු $x$ හි ශ්‍රිතයක් යැයි ගනිමු. එය $y = \mathrm{f}(x)$ මගින් නිරූපණය කරයි. $x$ ඛණ්ඩාංකය $x_0$ වන පරිදි $y = \mathrm{f}(x)$ වක්‍රය මත ඇති ලක්ෂ්‍යයක් P යැයි ගනිමු.

එනම් $\mathrm{P} \equiv (x_0, \mathrm{f}(x_0))$

Q යනු $y = \mathrm{f}(x)$ වක්‍රය මත P ට ආසන්න ලක්ෂ්‍යයක් යැයි ගනිමු.

Q හි $x$ ඛණ්ඩාංකය $x + h$ නම්, එවිට $\mathrm{Q} \equiv (x_0 + h, f(x_0 + h))$ වේ.

PQ ඡේදන රේඛාවේ බෑවුම $m_{\mathrm{PQ}}$ ලෙස නිරූපණය කරමු.

එවිට $m_{\mathrm{PQ}} = \dfrac{f(x_0 + h) - f(x_0)}{x_0 + h - x_0}$ $h \neq 0$ සඳහා

$= \dfrac{f(x_0 + h) - f(x_0)}{h}$ $h \neq 0$ සඳහා


එවිට $m_{\mathrm{PQ}} = \dfrac{f(x_0 + h) - f(x_0)}{x_0 + h - x_0}$ $h \neq 0$ සඳහා

$= \dfrac{f(x_0 + h) - f(x_0)}{h}$ $h \neq 0$ සඳහා


$h \to 0$ විට $\lim m_{\mathrm{PQ}}$ තාත්ත්වික සංඛ්‍යාවක් ලෙස පවතියි නම්, එය $y = f(x)$ ප්‍රස්තාරයට P හිදී ඇති ඇඳි ස්පර්ශක රේඛාවේ අනුක්‍රමණය $m$ ලෙස අර්ථ දක්වයි.

$$m_{\mathrm{PQ}} = \lim_{h \to 0} \frac{f(x_0 + h) - f(x_0)}{h}$$




$y = f(x)$ වක්‍රයට P හි දී ඇඳි, බෑවුම $m$ වූ ස්පර්ශක රේඛාවේ සමීකරණය,

$f(x) - f(x_0) = m(x - x_0)$

2. ස්පර්ශක රේඛාවේ බෑවුම අර්ථ දැක්වීම සඳහා භාවිත කළ

$\lim\limits_{h \to 0} \dfrac{f(x_0 + h) - f(x_0)}{h}$ යන සීමාවට නමක් සහ අංකනයක් ඇත. වෙනත් විවිධ අවස්ථාවල දී ද දක්නට ලැබෙන බැවින් එය $x = a$ හි දී $f(x)$ ව්‍යුත්පන්නය ලෙස හඳුන්වන අතර එය $x = x_0$ දී $f(x)$ අවකලනය යැයි ද එහි සීමාව (තාත්ත්වික සංඛ්‍යාවක් ලෙස) පවතියි යැයි ද දී ඇති විට $f^1(x_0)$ ලෙස අංකනය කරයි.

සුදුසු උදාහරණ භාවිතයෙන් පහත අවස්ථාවල දී, $x = x_0$ දී $f(x)$ හි ව්‍යුත්පන්නය නොපවතින බව පැහැදිලි කරන්න.

(i) $x = x_0$ ඇතුළත් විවෘත ප්‍රාන්තරය තුළ $f$ අර්ථ දක්වා නොමැති විට,

(ii) $\lim\limits_{h \to 0} \dfrac{f(x_0 + h) - f(x_0)}{h}$ පරිමිත නොවන විට,

(iii) $\lim\limits_{h \to 0} \dfrac{f(x_0 + h) - f(x_0)}{h}$ අර්ථ නොදැක්වෙන විට

එසේම සියලු $x$ අගයන් සඳහා ව්‍යුත්පන්නය පවතින පරිදි වූ $f$ ශ්‍රිතය $f(x)$ හි ව්‍යුත්පන්න ශ්‍රිතය ලෙස හඳුන්වයි.

එනම්, $(f^1)(x) = f^1(x)$ සහ $f^1(x) = \lim\limits_{h \to 0} \dfrac{f(x+h) - f(x)}{h}$

3. $y$ යනු $y = \mathrm{f}(x)$ මගින් දෙනු ලබන $x$ හි ශ්‍රිතයක් යැයි ගනිමු. ඕනෑ ම $x$ අගයක් සලකමු. $x$ සහ $x + \Delta x$ අන්ත ලක්ෂ්‍ය ලෙස පවතින සංවෘත ප්‍රාන්තරය තුළ $x$ හි වෙනස් වීම $\Delta x$ යැයි සලකමු.



$x$ අගයේ වෙනස් වීම වන $\Delta x$ ට අනුරූප $y$ අගයේ වෙනස් වීම අංකනය කරන $\Delta y$ යන්න $f(x+\Delta x)-f(x)$ ට සමාන වේ.

එම නිසා, $x$ සහ $x+\Delta x$ අන්ත ලක්ෂ්‍ය ලෙස පවතින සංවෘත ප්‍රාන්තරය තුළ වූ $x$ ට සාපේක්ෂ ව $y$ වෙනස් වීමේ මධ්‍යක ශීඝ්‍රතාව $\dfrac{\Delta y}{\Delta x}$ වේ.

මෙම $\dfrac{\Delta y}{\Delta x}=\dfrac{f(x+\Delta x)-f(x)}{\Delta x}$ වේ. $\Delta x$ යනු සංකේතයක් මිස එය $\Delta$ හා $x$ හි ගුණිතයක් නොවේ, යන්න අවධාරණය කරන්න.

$x$ ට සාපේක්ෂව $y$ වෙනස් වීමේ ක්ෂණික ශීඝ්‍රතාව

$\lim\limits_{\Delta x\to 0}\dfrac{\Delta y}{\Delta x}=\lim\limits_{\Delta x\to 0}\dfrac{f(x+\Delta x)-f(x)}{\Delta x}$ ලෙස අර්ථ දක්වයි.

සීමාව තාත්ත්වික සංඛ්‍යාවක් ලෙස පවතී යැයි දී ඇති විට,

$\lim\limits_{\Delta x\to 0}\dfrac{\Delta y}{\Delta x}=f^1(x)$ බව සඳහන් කරන්න.

$\lim\limits_{\Delta x\to 0}\dfrac{\Delta y}{\Delta x}$ යන්න $\dfrac{dy}{dx}$ ලෙස ද අංකනය කරයි.

එමගින් $f^1(x)$ හා $\dfrac{dy}{dx}$ යන්න සමාන වේ.

## නිපුණතා මට්ටම 14.2

1. $n$ පරිමේය සංඛ්‍යාවක් වන විට $x^n$ හි අවකලනය සහ මූලික ත්‍රිකෝණමිතික ශ්‍රිතවල අවකලනය, ප්‍රමූලධර්ම මගින් සොයන ආකාරය පෙන්වා දෙන්න.

   - පහත ප්‍රතිඵල සාධනය කර ඉදිරිපත් කරන්න.

$$\frac{d}{dx}x^n=nx^{n-1} \qquad \frac{d}{dx}(\cot x)=-\operatorname{cosec}^2 x$$

$$\frac{d}{dx}(\sin x)=\cos x \qquad \frac{d}{dx}(\sec x)=\sec x\tan x$$

$$\frac{d}{dx}(\cos x)=-\sin x \qquad \frac{d}{dx}(\operatorname{cosec} x)=-\operatorname{cosec} x\cot x$$

$$\frac{d}{dx}(\tan x)=\sec^2 x$$

## <u>නිපුණතා මට්ටම 14.3</u>

1. පහත සඳහන් ප්‍රතිඵල සාධනය කර පෙන්වන්න.

   (i) $k$ නියතයක් විට $f(x)=k$ නම් $f'(x)=0$

   (ii) $f(x)=kg(x)$ නම් $f'(x)=kg'(x)$

   (iii) $f(x)=g(x)\pm h(x)$ නම් එවිට $f'(x)=g'(x)\pm h'(x)$

   - $\frac{d}{dx}\left(x^n\right)=nx^{n-1}$ ප්‍රතිඵලය සහ ඉහත ප්‍රමේයය භාවිතයෙන් සුදුසු නිදසුන් කිහිපයක් සිසුනට පහදා දී ගැටලු විසඳීමට යොමු කරන්න.

2. (i) ගුණිත නීතිය

$$\frac{d}{dx}[f(x).g(x)]=f(x)\frac{d}{dx}[g(x)]+g(x)\frac{d}{dx}[f(x)]$$

   (ii) බෙදීමේ නීතිය

$$\frac{d}{dx}\left[\frac{f(x)}{g(x)}\right]=\frac{g(x)\frac{d}{dx}[f(x)]-[f(x)]\frac{d}{dx}[g(x)]}{[g(x)]^2};\ g(x)\neq 0 \text{ විට}$$

   (iii) දාම නීතිය

   $y$ යනු $u$ හි ශ්‍රිතයක් ද $u$ යනු $x$ හි ශ්‍රිතයක් ද වන විට $\frac{dy}{dx}=\frac{dy}{du}.\frac{du}{dx}$

   - දාම නීතිය හා එහි විස්තීරණයෙහි සාධනය අවශ්‍ය නොවේ.
   - ඉහත ප්‍රතිඵල භාවිතයෙන් ගැටලු විසඳන්න.

## <u>නිපුණතා මට්ටම 14.4</u>

1. (i) $\frac{d}{dx}(\sin^{-1}x)=\frac{1}{\sqrt{1-x^2}}$ ; $-1<x<1$

   (ii) $\frac{d(\cos^{-1}x)}{dx}=\frac{-1}{\sqrt{1-x^2}}$ ; $-1<x<1$

   (iii) $\frac{d(\tan^{-1}x)}{dx}=\frac{1}{1+x^2}$ ; $-\infty<x<\infty$ බව අපෝහනය කරන්න.

2. ඉහත සූත්‍ර භාවිතයෙන් විවිධ ශ්‍රිත අවකලනය කිරීමට සිසුන් යොමු කරන්න.

## නිපුණතා මට්ටම 14.5

1. අපරිමිත ශ්‍රේණියක ඓක්‍යය වන $1+\frac{x}{1!}+\frac{x^2}{2!}+\frac{x^3}{3!}+\dots+\frac{x^n}{n!}+\dots$ යන්න $e^x$ මගින් දක්වන බවත් එය ප්‍රකෘති ඝාතීය ශ්‍රිතය ලෙස හඳුන්වන බවත් ප්‍රකාශ කරන්න.
2. ප්‍රකෘති ඝාතීය ශ්‍රිතයේ වසම $\mathbb{R}$ ද පරාසය $(0,\infty)$ ද බව ප්‍රකාශ කරන්න.
3. $x=1$ විට, $e=e^1=1+\frac{1}{1!}+\frac{1}{2!}+\dots+\frac{x^n}{n!}+\dots$ ලෙස ලැබෙන බව ප්‍රකාශ කරන්න.

   $e$ ධන අපරිමේය සංඛ්‍යාවක් බවත් $e\simeq 2.718$ බවත් ප්‍රකාශ කරන්න.
4. (i) $e^0=1$

   (ii) $e^{x_1+x_2}=e^{x_1}e^{x_2}$

   (iii) $e^{x_1-x_2}=\frac{e^{x_1}}{e^{x_2}}$

---

## නිපුණතා මට්ටම 14.6

1. $f(x)=e^x$ ශ්‍රිතයේ ප්‍රතිලෝම ශ්‍රිතය ලෙස ප්‍රකෘති ලඝුගණක ශ්‍රිතය $\ln x$ හඳුන්වා දෙන්න.

   $\ln x$ යන්න $y=\ln x \Leftrightarrow x=e^y$ ලෙස අර්ථ දක්වන්න.
2. $g(x)=\ln x$ නම් $g$ හි වසම $(0,\infty)$ ද පරාසය $\mathbb{R}$ ද බව ප්‍රකාශ කරන්න.
3. $(i)$ $x>0$ සඳහා පමණක් අර්ථ දක්වයි.

   $(ii)$ $\ln(e^x)=x$, $x\in\mathbb{R}$ සඳහා

---

   $(iii)$ $e^{\ln x}=x$ ; $x>0$ සඳහා

   $(iv)$ $\ln(xy)=\ln x+\ln y,\ x>0,\ y>0$ සඳහා

   $(v)$ $\ln\left(\frac{x}{y}\right)=\ln x-\ln y,\ x>0,\ y>0$ සඳහා

   $(vi)$ $\ln(x^b)=b\ln x,\ x>0$ යන ගුණ ඉදිරිපත් කරන්න.
4. ප්‍රතිලෝම ගුණ භාවිතයෙන් $y=\ln x$ හි ප්‍රස්තාරයේ දළ සටහනක් අඳින්න.
   - $y=x$ මත $y=e^x$ හි දර්පණ ප්‍රතිබිම්බය ලෙස $y=\ln x$ හි ප්‍රස්තාරය ලැබෙන බව පහදන්න.

5. $a>0$ සඳහා $a^x$ ශ්‍රිතය $a^x=e^{x\ln a}$ ලෙස අර්ථ දක්වන්න.

6. $h(x)=a^x$ නම් $h$ හි වසම $\mathbb{R}$ ද පරාසය $h=(0,\alpha)$ ද බව පෙන්වා දෙන්න.

7. ප්‍රකෘති ලඝුගණක ශ්‍රිතය ආශ්‍රිත ගැටලු විසඳීමට සිසුන් යොමු කරන්න.

8. $x>0$ සඳහා $\ln x$ හි ව්‍යුත්පන්නය $\frac{d}{dx}(\ln x)=\frac{1}{x}$ බව අපෝහනය කරන්න.

9. $\frac{d}{dx}(a^x)=(\ln a)a^x$ බව අපෝහනය කරන්න.

10. $x$ හි ව්‍යුත්පන්නය භාවිතයෙන් ගැටලු විසඳීමට සිසුන් යොමු කරන්න.

**<u>නිපුණතා මට්ටම 14.7</u>**

1. $f(x,y)=0$ ආකාරයේ සමීකරණයක් තෘප්ත කරන $y=f(x)$ ශ්‍රිතයක් අධ්‍යාහෘත ශ්‍රිතයක් ලෙස අර්ථ දක්වයි.
   $x^2+y^2-1=0$ මගින් මෙය පැහැදිලි කරන්න.
2. $f(x,y)=0$ සමීකරණය මගින් අර්ථ දැක්වෙන $y=f(x)$ අධ්‍යාහෘත ශ්‍රිතයක ව්‍යුත්පන්නය ලබා ගැනීම සඳහා $x$ ඇසුරින් $y$ සඳහා අධ්‍යාහෘතයක් ලබාගෙන ඉන්පසු ව්‍යුත්පන්නය ලබා ගන්න. (මෙහි දී $f(x,y)=0$ විසඳීම අවශ්‍ය නොවන අතර එය සමහර අවස්ථාවල කිරීමට ද නොහැකිය) ඒ වෙනුවට අපි $f(x,y)=0$ හි

---

දෙපස ම දාම නීතිය මගින් අවකලනය කරමු. උදාහරණ භාවිතයෙන් විස්තර කරන්න.

$t$ පරාමිතයක් විට $C$ වක්‍රයක් $x=f(t)$ සහ $y=f(t)$ පරාමිතික සමීකරණ මගින් අර්ථ දක්වයි.

එවිට $\frac{dy}{dx}$ ව්‍යුත්පන්නය $\frac{dx}{dt}\neq 0$ සඳහා වන ලක්ෂ්‍යවල දී $\frac{dy}{dx}=\frac{\left(\frac{dy}{dt}\right)}{\left(\frac{dx}{dt}\right)}$ ලෙස ලබා ගත හැකි ය.

$\frac{dx}{dt}\neq 0$ විට $\frac{d^2y}{dx^2}=\frac{\frac{d}{dt}\left(\frac{dy}{dx}\right)}{\frac{dx}{dt}}$ බව ද පෙන්වා දෙන්න. උදාහරණ මගින් පැහැදිලි කරන්න.

3. පරාවලය $y^2 = 4ax$ , ඉලිප්සය $\frac{x^2}{a^2}+\frac{y^2}{b^2}=1$, බහුවලය $\frac{x^2}{a^2}-\frac{y^2}{b^2}=1$, $xy=c^2$ වැනි අව්‍යක්ත ශ්‍රිත හා පරාමිතික සමීකරණ ඇතුළත් වන අවකලන ඉදිරිපත් කරන්න.

$y^2 = 4ax$ : $x = at^2, y = 2at$

$\frac{x^2}{a^2}+\frac{y^2}{b^2}=1$ : $x = a\cos\theta, y = b\sin\theta$

$\frac{x^2}{a^2}-\frac{y^2}{b^2}=1$ : $x = a\sec\theta, y = b\tan\theta$

$xy = c^2$ : $x = ct, y = \frac{c}{t}$

4. ඉහත වක්‍ර ද ඇතුළත් ව පරාමිතික ආකාරයෙන් අර්ථ දක්වන ලද වක්‍ර මත ලක්ෂ්‍යවල දී ස්පර්ශකයේ සහ අභිලම්බයේ සමීකරණ ලබා ගන්න.
ඉහත සඳහන් වක්‍රවල දළ සටහන් අඳින අයුරු සහ ඒවායේ මූලික ගුණ පැහැදිලි කරන්න.

---

## නිපුණතා මට්ටම 14.8

1. $y$ යනු $x$ හි ශ්‍රිතයක් විට $y$ හි $n$ වන ගණයේ ව්‍යුත්පන්න ලෙස හැඳින්වෙන්නේ $y$ ශ්‍රිතය $x$ විෂයෙන් $n$ වාරයක් අවකලනය කිරීමෙන් ලැබෙන ශ්‍රිතයයි. එ
$\frac{d^n y}{dx^n}$ හෝ $f^n(x)$ හෝ $y^n$ මගින් නිරූපණය කරයි.
2. උදහරණ මගින් පැහැදිලි කරන්න.
3. ඉහළ ගණවල ව්‍යුත්පන්න ඇතුළත් ගැටලු විසඳීමට සිසුන් යොමු කරන්න.